
# නව සමාගම් පනත

## 2007 අංක 7 දරන සමාගම් පනත



සංවාද
SANVADA
சம்வாதம்

ප්‍රකාශනය - 05

pathfinder
Foundation

### හැඳින්වීම

2007 අංක 7 දරන සමාගම් පනත, (ඉදිරියේ දී "පනත" යනුවෙන් සඳහන් කරනු ලබන) බොහෝ කරුණු හේතු කොටගෙන ශ්‍රී ලංකාවේ සමාගම් නීති සංවර්ධනයෙහි ලා වැදගත් සන්ධිස්ථානයක් වන්නේ ය. ප්‍රථමයෙන් ම ඉංග්‍රීසි නීතිය සමඟ එහි තුබුණු සාම්ප්‍රදායික සම්බන්ධතාවෙන් ඉවත්ව කැනඩාවෙහි සහ නවසීලන්තයෙහි පවත්නා ආකාරයේ ආකෘතිකමය පදනමක් මත සැකැසුණු නීති ක්‍රමයක් බවට පත් වීම තුළින් සමාගම් නීතියෙහි වැදගත් වූ ද ප්‍රබල වූ ද වෙනස් වීමක් සිදු වූයේ ය. දෙවනුව, අප ගේ සමාගම් නීතියෙහි හරය තුළ වූ ඇතැම් මූලික සංකල්පයන් බැහැර කරමින් වෙනත් සංකල්පයන් එතැනට පත් වීමෙන් අතිශය වැදගත් වෙනස්කම් කීපයක් ද සිදු වී ඇත. න්‍යායාත්මක ලෙස දකුණු ආසියාවෙහි වෙනත් රටවල පවත්නා සමාගම් නීතීන්ට ඉදිරියෙන් සිටිමින් ශ්‍රී ලංකාවේ සමාගම් නීතිය නවීකරණය වීම තෙවනුව මෙහි ලා කැපී පෙනෙන ප්‍රතිඵලයයි. මෙහි දී නීතිය තුළ ඇතැම් ධනාත්මක ලක්ෂණ පහළ වී ඇති නමුදු එහි ද සදොස් තැන් නැතිවා නොවේ. පනතෙහි අන්තර්ගතය හා සම්බන්ධයෙන් පමණක් නොව, එය නිර්මාණය වූ සහ ක්‍රියාවට නැංවුණු ආකාරයන් පිළිබඳව ද බොහෝ විවේචනයන් තිබේ. එබැවින් පනතෙහි ඇතුළත් කරුණු පිළිබඳව මෙන් ම එය ක්‍රියාවට නැංවීමේ වැඩ පිළිවෙළ පිළිබඳව ද සූක්ෂම විමර්ශනයක යෙදීමෙහි අවශ්‍යතාව මතු වෙයි.

ශ්‍රී ලංකාවෙහි සමාගම් නීතිය සාම්ප්‍රදායිකව පැවැතියේ එංගලන්තයේ නීතිය මත පදනම්ව ය. 1982 අංක 17 දරන සමාගම් පනත 1982 වර්ෂයේ දී ශ්‍රී ලංකාව තුළ ක්‍රියාත්මක විණි. මෙම නීතිය ද 1948 ඉංග්‍රීසි සමාගම් නීතිය මත පදනම් වූවක් වූ අතර, ආරම්භයේ දී ම එය ක්‍රියාවට නැංවුණේ, දශක හතරකටත් වැඩි ප්‍රමාණයකින් යල් පිනූ නීතියක් වශයෙන් ය.

ශ්‍රී ලංකාවෙහි අක්‍රීය ප්‍රාග්ධනය මෙන් ම මූල්‍ය වෙළෙඳපොළ ද පණ ගැන්වෙන ආකාරයේ ප්‍රබල බලපෑමක් ඇති කරවමින් රටෙහි වානිජ සහ ආර්ථික කටයුතුවල සැලකිය යුතු වර්ධනයක් 1980 දශකයේ අග භාගයේ දී සහ 1990 දශකයේ මුල් භාගයේ දී සිදු වූයේ ය. කොළඹ කොටස් වෙළෙඳපොළ ප්‍රතිව්‍යුහගත කිරීම ඔස්සේ එකී වර්ධනයන් දිරි ගැන්වීම උදෙසා, මෙහෙයැවුම් හා නියාමන යටිතලයන් වැඩි දියුණු කිරීම, කොටස් හා විනිමය කොමිසමත්, ශ්‍රී ලංකා ගිනුම්කරණ සහ විගණන ප්‍රමිති මණ්ඩලයත් වැනි අනුපූරක ආයතන පිහිටුවාලීම, දැඩි පෞද්ගලීකරණ ක්‍රියාදාමයන් වැනි පියවර ගණනාවක් රජය විසින් ගනු ලැබූ නමුදු, ඒවාට සමගාමී වර්ධනයක් සමාගම් නීතියෙහි සිදු වූයේ නැත. මෙම හේතුව නිසා නිතර ගැටළුවලට මුහුණ දීමට සංවර්ධනය ක්‍රියා කරවන යන්ත්‍රය වූ පෞද්ගලික අංශයට සිදු වූයේ ය. වානිජමය කොන්දේසි මත මූල්‍යකරණ තරඟයක යෙදීම අනිවාර්ය වී තුබුණු නමුදු නව මූල්‍යකරණ ක්‍රමවේදයන් නිර්මාණය කර ගැනීමේ අවශ්‍යතාව පෞද්ගලික අංශය ඉදිරියට පැමිණියේ ය. මෙයට අමතරව සිය හිමිකම් ආරක්ෂා කරගැනීම පිණිස ප්‍රමාණවත් පහසුකම් අයෝජකයන් වෙත නීතිය විසින් ද සැපයිය යුතුව තිබිණි. මෙය නීතිය ඔස්සේ ඉටු වන බවක් නො පෙනිණි. නව සමාගම් පනතක් සකස් කිරීම මඟින් මෙම ගැටලුව සඳහා විසඳුම් සෙවීමට 1993 දී හෝ ඊට ආසන්න වකවානුවේ දී රජයට සිදු වූයේ එබැවිනි.

කිනම් ආදර්ශයක් මත පිහිටා නව නීතිය සකස් කළ යුතු ද යන්න මෙහි දී මතු වුණු එක් මූලික ගැටළුවකි. ඒ සඳහා ඉංග්‍රීසි නීතිය පදනමක් විය යුතු බව යන්න නිතැතින් මතු වන මෙන් ම ජනප්‍රිය මතය ද වන නමුදු ඊට වෙනස් මඟක් ගැනීම සඳහා හේතු වූ කරුණු ගණනාවක් ම තිබුණු අතර අවසානයේ දී, නවසීලන්තයේ 1993 සමාගම් පනතට බොහෝ දුරට සමාන වූ ආදර්ශයක් මේ සඳහා පදනම් කොට ගැනිණි.

### නීතිය සම්මත කර ගැනීමේ දී මතු වුණු ගැටලු

පනතෙහි ආරම්භක විමර්ශන කෙටුම්පත 1995 දී මහජන අදහස් සඳහා ඉදිරිපත් කැරෙනවාත් සමඟම දැඩි විරෝධතා රැල්ලක් මතු වූයේ ය. කෙටුම්පතෙහි වූ විවිධ වැදගත් ප්‍රතිපාදනයන් විෂයෙහි වූ විරෝධයන්ට අමතරව ඉංග්‍රීසි නීතිය හා පැවැති සම්බන්ධතාව කෙරෙන් අප ගේ සමාගම් නීතිය බැහැර විය යුතු ය යන මතය ද විරෝධයට පාත්‍ර වූයේ ය. මෙම සංවාදය වසර දොළහකට ද වැඩි කාලයක් තිස්සේ පැවැති බැවින් අවසාන වශයෙන් එය පාර්ලිමේන්තුවේ දී සම්මත වූයේ 2007 මැයි මාසයේ දී ය. මෙම නීතිය දැනට ක්‍රියාත්මකව පවතින නමුදු, නීතිය ක්‍රියාවට නැංවීමේ දී අනුගමනය කැරුණු ක්‍රියා පටිපාටිය ද නීතියෙහි ඇතැම් වැදගත් ප්‍රතිපාදනයන් ද නීතිය ක්‍රියාත්මක කිරීමට සූදානම් නැති වීම ද පිළිබඳ ප්‍රශ්න රාශියක් දැනට ද නො විසඳී පවතී.

### කාර්යපටිපාටිමය ගැටලු

මෙකී නීතිය සැකසීමේදී ඇතැම් කරුනු ඇතුළත් නොවීම ද, අදහස් විමසීමකින් හා පාරදෘෂ්‍යභාවයකින් තොර වීම ද, නීතිය සකස් වීම හා ක්‍රියාවට නැංවීමත් පිළිබඳව මතු කොට පෙන්වනු ලබන එක් ගැටලුවකි. නව නීතිය සඳහා පදනම් කරගත යුතු ආදර්ශය තීරණය කිරීම සඳහා අදාළ පාර්ශ්වකරුවන්ගේ අදහස් නො විමසන ලදැයි යන මතය ආරම්භක නීති කෙටුම්පත සකස් වෙමින් පවතින අතරතුර දී දැඩි සේ මතුවිණි. අවසාන ආදර්ශය වශයෙන් නවසීලන්ත නීතිය තෝරා ගැනීම සාධාරණ වූව ද, වෙළෙඳපොළ හුරු පුරුදුව තුබුණේ ඉංග්‍රීසි නීතියට ය යන්න පිළිබඳව ද නිසි අවධානයක් යොමු කළ යුතුව තුබුණු බවට ද විශ්වාසයක් පැවැතිණි.

මෙම මූලික ගැටළුව හඳුනාගනු ලැබ තුබුණේ නම් හා නිසි අදහස් විමසීමක් සිදු කරන ලද්දේ නම්, පනත කෙරෙහි එල්ල වන විරෝධතාවන් බොහොමයක් වලක්වා ගැනීම ද, එහි වැදගත් කරුනු පිළිබඳව වැඩි අවධානයක් යොමු කිරීම ද කළ හැකිව තිබිණි.

පනත පිළිබඳව නැඟුණු මහජන මතයන් කෙරෙහි ඵලදායීව ප්‍රතිචාර දැක්වීමටත්, පනතෙහි අවශ්‍යතාව මෙන් ම ඉන් ලැබෙන ප්‍රතිලාභයන් පිළිබඳව ප්‍රමාණවත් දැනුවත් භාවයක් ඔවුන් තුළ ඇති කරවීමටත් බලධාරීන් අසමත් වීම ද මෙම පටිපාටියෙහි ඌනතාවක් විය. මෙම ක්‍රියාවලියෙහි නුන්වැනි පැත්ත වන්නේ විවේචනයන් විෂයෙහි ප්‍රතිපත්ති සම්පාදකයන් දැක්වූ ප්‍රතිචාරයයි. එල්ල වන දැඩි විවේචනයන් හමුවේ කෙටුම්පත සංස්කරණය වීම වලක්වා ලීමට එවකට පනත සම්මත කර ගැනීමේ වගකීම දැරූ සමාගම් නීති උපදේශක කොමිසම පියවර ගත්තේ ය. මෙය බොහෝ කොටස් විසින් සලකනු ලැබුයේ පනත් කෙටුම්පත තව දුරටත් විවේචනයට භාජන වීම වලක්වාලීම පිණිස ගනු ලැබූ පියවරක් ලෙසට ය. තීරණාත්මක මොහොතක දී කෙටුම්පත සංසරණයෙන් ඉවත් කරගැනීම හේතු කොටගෙන පාර්ලිමේන්තුවේ සම්මත වීමට පෙර එහි වැදගත් ප්‍රතිපාදනයන් පූර්ණ සාකච්ඡාවකට භාජන වීම වැලකී ගියේ ය. නව අවශ්‍යතා සඳහා සකස් වීම පිණිස අවශ්‍ය යටිතලයන් සකසා ගැනීමට ප්‍රමාණවත් කාලයක් ලබා ගැනීමේ ඉඩ කඩ වෙළෙඳපොළ ද, ව්‍යාපාරිකයන් ද නියාමකයන් ද ආදී බොහෝ පාර්ශවකරුවන්ට ලබාගත නො හැකි වන සේ පනත කඩිමුඩියේ පාර්ලිමේන්තුවට ඉදිරිපත් කොට සම්මත කරන ලදී.

සමාගම් පනතට ම අනුපූරක වන්නා වූ, කොළඹ කොටස් වෙළෙඳපොළෙහි ලැයිස්තුගත කිරීමේ නියමයන් ආදී වෙනත් නීති රීතීන් සමඟ සුසංගත වීම සඳහා ද පනත ක්‍රියාත්මක කිරීමට පෙර ප්‍රයත්නයක් දරා නැත. පනතෙහි පාර්ශවකරුවන් මෙන් ම වෙළෙඳපොළ ද දැඩි අපහසුතාවන්ට පත් කරවීමක් මෙම ඌනතාවන් හේතු කොටගෙන සිදු වී ඇති අතර ඔවුහු එකී අපහසුතාවන්ට දැනට ද මුහුණ දෙමින් සිටිති.

මෙම තත්ත්වයන් යටතේ අවශ්‍යතා කීපයක් මතු වී පෙනේ. මේ ආකාරයේ නීති සකස් කිරීමේ දී එහි ස්වීයත්වය පිළිබඳ හැඟීමක් ඇති කරවීම ද, පනතෙහි කරුණු පිළිබඳ මහජන අවබෝධයක් ඇති කරවමින් හා අවශ්‍ය තොරතුරු එහි පාර්ශවකරුවන්ට දැන ගැනීමට සලස්වමින් පනත පූර්ණ සාකච්ඡාවකට භාජන කරවා ඔවුන් ගේ අවශ්‍යතාවන්ට එමඟින් විසඳුම් ලබා දීම ද, එවැනි නීති ක්‍රියාත්මක වීමට සැලැස්වීමට පෙර ඊට ගැලැපෙන සේ පසුතලය සකස් කරවීම ද එසේ ම, අවබෝධ ලබාගැනීම පිණිස මහජනතාව වෙත ප්‍රමාණවත් කාලයක් ලබා දීම ද, එකී අවශ්‍යතාවන් වන්නේ ය.

## සුවිශේෂී කරුණු

පහත සැකෙවින් සඳහන් වන්නේ පනතෙන් ඇති කැරෙන ප්‍රධාන වෙනස්කම් ය.

■ **ගිවිසුම් වශයෙන් තුබුණු පාර්ශ්වකරුවන්ගේ අයිතීන් නීති බවට පත් වීම.**

පාර්ශ්වකරුවන්ගේ සම්බන්ධතාව ගිවිසුමක තත්ත්වයෙන් නීතියක් බවට පරිවර්තනය කිරීම තුළින් සුවිශේෂී වෙනසක් පනත විසින් ඇති කරනු ලැබ තිබේ. පෞද්ගලික අභියෝදනයන් හා නඩුකරයන් මඟින් පනතෙහි ප්‍රතිපාදනයන් බලගැන්වීමේ අයිතිය පාර්ශ්වකරුවන්ට මෙන් ම අධ්‍යක්ෂවරුනට ද ලබා දෙන ස්වෝපකාර (self-help) අංගයක් එකතු කිරීමෙන් මෙහි ලා මූලික වෙනසක් පනත විසින් ඇති කරවනු ලබයි. නීතියෙහි ප්‍රතිපාදනයන්ට මනා අනුකූලතාවකින් යුතුව නීතියෙහි නිසි ශක්තිය බාහිර නියාමක ලෙස ක්‍රියාත්මක වන සමාගම් රෙජිස්ට්‍රාර් සතුව නොමැති බව පැහැදිලිව පෙනී යන බැවින් මෙම ප්‍රවේශය ප්‍රායෝගික ද යථාර්ථවාදී ද වන්නේ ය.

■ **ශ්‍රී ලංකාවේ සමාගම් නීතියෙහි පාදක හරයේ සැකැස්ම ලෙස කලක සිට පැවැති සංකල්පයන් සහ මූලධර්මයන් බැහැර කිරීම.**

පෙර පැවැති නීතිය යටතේ තිබුණු බොහෝ සංකල්පයන් නව නීතිය විසින් බැහැර කරනු ලබයි. සමාගම් පරමාර්ථ ප්‍රකාශයක (සාංගමික සංස්ථාපත්‍රයක යනුවෙන් ද හැඳින්වේ.) අවශ්‍යතාව ද, අනුදත් ප්‍රාග්ධනය පිළිබඳ සංකල්පය ද, අරමුණු පිළිබඳ වගන්තියක අවශ්‍යතාව සහ බලාතික්‍රමණ (*ultra vires*) සිද්ධාන්තය භාවිතයට ගැනීමේ අවශ්‍යතාව ද, එසේ ම කොටස්වල සම අගය පිළිබඳ සංකල්පය ද, යනු එසේ බැහැර කරන ලද ඒවා ය. පෙර නීතිය යටතේ පැවැති මහජන සමාගම් පිළිබඳ සංකල්පය ද නව නීතිය යටතේ අවලංගු වන්නේ ය.

■ **පෙර නීතිය යටතේ පැවැති සීමාවන් ඉවත් කරමින් සමාගම් සංස්ථාපනයෙහි හා කළමනාකරණයෙහි ලා වඩාත් නම්‍යශීලී බවක් ලබා දීම.**

සමාගම් ව්‍යුහයක් හා අදාළ මෙහෙයවුම් පිරිවැය පහත හෙළමින් එහි සරල බවක් ඇති කරවීම නව නීතියෙහි එක් ප්‍රධාන අරමුණකි. ඒ අනුව, සමාගම් පරමාර්ථ ප්‍රකාශයක අවශ්‍යතාව බැහැර කිරීම ද සරල ආදායම් පත්‍රයක් පරිගණකගතව තැබීම ද ඔස්සේ සංස්ථාපන ක්‍රියාවලිය පහසු කරවීමට නව නීතිය විසින් පියවර ගනු ලැබ තිබේ. එසේ ම තනි කොටස්කාර සමාගම් සඳහා ද, පනතෙහි විශේෂිතව දැක්වෙන යම් යම් උපචාරයන්ට අනුව සමාගමෙන් ඉවත්ව යාමේ අවසරය ලැබෙන සේ පෞද්ගලික සමාගම්වල මෙහෙයැවුම් වඩාත් නම්‍යශීලී කරවීම සඳහා පමණක් නොව මෙහෙයැවුම් ක්‍රියාවලිය සරල කරවන තවත් විවිධ ප්‍රතිපාදනයන් ද මෙම පනතෙහි ඇතුළත් ය.

මෙකී සරල කිරීමේ ක්‍රියාවලිය යටතේ ම පෙර නීතිය යටතේ පැවැති තවත් බොහෝ පටිපාටිමය විධිවිධාන බැහැර කැරෙයි. ප්‍රකාශිත ප්‍රාග්ධනය අඩු කිරීම සඳහා ද කොටස් ආපසු මිල දී ගැනීම සඳහා ද අධිකරණයේ අනුමැතිය තව දුරටත් අවශ්‍ය නොවීම එයට උදාහරණයකි.

■ **ප්‍රාග්ධන සහ බෙදාලීම් හා අදාළ නව සංකල්පයන් හඳුන්වා දීම.**

සමාගම්වල මෙහෙයැවුම් හා සම්බන්ධ නව සංකල්පයන් ගණනාවක් නව පනත මඟින් හඳුන්වා දෙනු ලබයි. මූලික වශයෙන් මේවා අදාළ වන්නේ ප්‍රාග්ධනය සහ බෙදාලීම් විෂයෙහි ය. නිකුත් කළ ප්‍රාග්ධන සංකල්පය වෙනුවට ප්‍රකාශිත ප්‍රාග්ධන සංකල්පයත්, එසේ ම ප්‍රාග්ධන පවත්වාගෙන යාමේ මූලධර්මය වෙනුවට “බුන්වත්බව” පිරික්සුමත් ව්‍යවහාරයට පැමිණ තිබීම උදාහරණ වශයෙන් දැක්විය හැකි ය.

බෙදාහැරීම කරදර අඩු ක්‍රියාවලියක් බවට පත් කරවමින් සිය සම්පත්වල උපරිම ප්‍රයෝජන ගැනීම පිණිස නව මාවත් ගණනාවක් වෙත අවතීර්ණ වීමේ අවසරය සමාගම්වලට ලබා දෙන මූලධර්ම සමුදායක් ද මෙම පනත මඟින් හඳුන්වා දෙනු ලැබ තිබේ.

■ **වැඩි පාරදෘශ්‍යභාවයක් සහිත අධ්‍යක්ෂවරුන් ගේ කාර්ය සංග්‍රහයක් සැකසීම.**

නඩු නීතිය ඔස්සේ වර්ධනය වුණු විවිධ මූලධර්මයන් සංග්‍රහගත කිරීම මඟින් නීතිය සරල කරවීමට පනත තුළින් උත්සාහ දරා තිබේ.
අධ්‍යක්ෂවරු, ඔවුන් ගේ කාර්යභාරය, ඔවුන් ගේ අයිතිවාසිකම් සහ යුතුකම් පිළිබඳව ලබා දී තිබෙන නිර්වචනයන් ඊට ඇතුළත් ය. මෙකී පුළුල් මූලධර්මයන් පිළිබඳ විග්‍රහයන්ට අමතරව අධ්‍යක්ෂවරුන් විසින් හෙළිදරව් කළ යුතු කරුණු ද පනතෙහි දැඩි ලෙස දක්වා තිබේ. සමාගම සමඟ කැරෙන ගනුදෙනු විෂයෙහි ද, සමාගමෙහි කොටස් විෂයෙහි ද, ඔවුන් ලබන පාරිශ්‍රමිකයන් විෂයෙහි ද ඔවුනට ඇති බැඳියාවන් මෙසේ හෙළිදරව් කළ යුතුව ඇති කරුනු අතර වේ. විශේෂයෙන් ම සමාගම මූල්‍ය අපහසුතාවන්ට පත් වූ අවස්ථාවන් හි දී අධ්‍යක්ෂවරුන් විසින් ගත යුතු පියවරයන් ඇතුළු ඔවුන් සතු ඇතැම් යුතුකම් ද පනතින් හඳුන්වා දෙනු ලැබේ. මෙකී වගකීම් ඉටු කිරීමට අසමත් වීම හේතු කොටගෙන අපරාධ සඳහා වූ දැඩි දඬුවම් විඳීමට ද, නුසුදුස්සන් බවට පත් වීමට ද එසේ ම ඇතැම් සිද්ධීන් සම්බන්ධයෙන් වන්දි ගෙවීමේ බැඳීමකට යටත් වීමට ද සිදු විය හැකි ය.

■ **පාර්ශ්වකරුවන්ගේ අයිතීන් හි ඉතා යහපත් සමබරතාවක් ඇතිකිරීම පිණිස පාර්ශ්වකරුවන්ගේ අයිතීන් ශක්තිමත් කරවීම සහ පාර්ශ්වකරුවන්ගේ අයිතීන් මෙන් ම ඒ හා අදාළ ප්‍රතිකර්ම හඳුන්වා දීම.**

විවිධ නව පාර්ශ්වකරුවන්ගේ ප්‍රතිකර්ම හඳුන්වා දිම නව පනතෙහි එක් සුවිශේෂත්වයකි. පනතෙහි ප්‍රතිපාදනයන් මෙන් ම සමාගමෙහි ව්‍යවස්ථාවන් ද උල්ලංඝනය කිරීමෙන් සමාගමෙහි අධ්‍යක්ෂවරුන් වලක්වා ලීම පිණිස ප්‍රතිබාධන හෙවත් වැළැක්වීමේ නියෝග ලබා ගැනීමෙහි සහ ව්‍යුත්පන්න ක්‍රියා මාර්ගයන්ට (Derivative Actions) එළැඹීමෙහි පාර්ශ්වකරුවන්ට ලබා දී ඇති අයිතිය මෙවැනි එක් ප්‍රතිකර්මයකි.

අධිකරණයක් ඔස්සේ බලගැන්විය යුතු මෙකී ප්‍රතිකර්මයන්ට අමතරව, කිසියම් විශාල ගනුදෙනුවක් සම්බන්ධයෙන් සිය එකගතාවක් නොමැති අවස්ථාවන් හි දී තම කොටස් මිල දී ගන්නා ලෙස සමාගමෙන් ඉල්ලා සිටීමට සුළුතර කොටස් හිමියනට අවස්ථාව ලැබෙන "සුළුතර කොටස් විකිණීමේ අයිතිය" පනත මඟින් කොටස් හිමියනට ලැබෙන්නේ ය.

- **අර්බුද විසඳාලීමේ විකල්ප ක්‍රමවේදයන් ඇති කිරීම**

පනතෙහි ප්‍රතිපාදනයන් බලගැන්වීමේ පියවරයන්ට එළැඹීමේ හැකියාව පාර්ශ්වකරුවන්ට අහිමි කරවන නඩු කීමේ අධික පිරිවැය පිළිබඳව ද පනතෙහි අවධානය යොමු වෙයි. ඒ අනුව එවැනි අවස්ථාවන්ට මැදිහත් වීමේ බලය සමාගම් අර්බුද මණ්ඩලයකට පනත මඟින් පැවැරෙන්නේ ය.

## පොදු නිගමනයන්

2007 අංක 7 දරන සමාගම් පනත ශ්‍රී ලංකාවේ සමාගම් නීතියෙහි වැදගත් සන්ධිස්ථානයක් වෙයි. එහි බොහෝ අංගයන් වූ කලී ඉන් පෙර පැවැති නීතියෙහි ම සිදු වුණු වර්ධනයකි. විශේෂයෙන් ම ප්‍රාග්ධන පිළිවෙත අධ්‍යක්ෂවරුන් ගේ යුතුකම් සහ පාර්ශ්වකරුවන්ගේ අයිතීන් හා සම්බන්ධයෙන් හඳුන්වා දෙනු ලැබ තිබෙන විධිවිධානයන් අනුව බලන කල, මෙහි සත්‍යතාව පැහැදිලි වන්නේ ය. එසේ වුව ද, තවදුරටත් සැලකිල්ලට සහ විමර්ශනයට භාජන විය යුතු ඇතැම් අංග මෙම පනතෙහි තිබේ. පහත දැක්වෙන්නේ ඉන් සමහරකි.

ඉහත දී සමාගම් විසින් අනුගමනය කරනු ලැබූ අත්‍යවශ්‍ය පරිචයන් කීපයක් හඳුනාගැනීම වුවමනාවෙන් ම හෝ අතපසුවීමකින් හෝ මෙම පනතෙහි දී සිදු කර නැත. ප්‍රසාද කොටස් (bonus) නිකුත් කිරීම හා සම්බන්ධයෙන් දක්වා තිබෙන සැලකිල්ල මෙයට ඉතා කදිම උදාහරණයකි. ප්‍රසාද කොටස් නිකුත් කිරීමේ හැකියාව බැහැර කරලීම, පනත කෙටුම්පත් කළ අය ගේ අධ්‍යාශය නොවූ බව පැහැදිලිව පෙනෙන නමුදු, ප්‍රසාද කොටස් නිකුත් කිරීමෙහි ලා සමාගම් වෙත බලය හා පසුකම් ලබා දීම පිණිස සමගාමී නීතීන් හි ඇතුළත්ව තිබෙන ප්‍රතිපාදනයක් මෙම පනතෙහි ඇතුළත් කිරීමට අතපසු වීම හේතු කොටගෙන නෛතික අවදානමකට මුහුණ පෑමකින් තොරව එවැනි නිකුත් කිරීමක් ක්‍රියාවට නැංවීමේ හැකියාව නැතිව ගොස් තිබේ.

ශ්‍රී ලංකාවෙහි ආර්ථික පරිසරය අනුව බලන කල ඉටු කිරීමෙහි ලා මහත් පරිශ්‍රමයක් අවශ්‍ය වෙතැයි පෙනෙන නොයෙකුත් වගකීම්, පනත විසින් අධ්‍යක්ෂවරුන් වෙත පවරනු ලැබ තිබේ. සමාගම් බුන්වත් භාවය පිළිබඳ ගැටළුවලට මුහුණ දෙන විට ඒවා ඇවර කිරීමට ක්‍රියා කළ යුතු ද නැද්ද යන්න පිළිබඳව අධ්‍යක්ෂවරුන් විසින් තීරණයක් ගනු ලැබිය යුතු බව පනතෙහි 219 සහ 220 වැනි වගන්තිවලින් කියැවෙයි. මනා පාලනයක් මෙන් ම පාර්ශ්වකරුවන්ට ගේ ආරක්ෂාව ද තහවුරු කරන මෙවැනි වගන්තීන් ප්‍රශංසනීය සේ පෙනුණ ද, වර්තමාන තත්ත්වයන් ගැන සලකන විට ශ්‍රී ලංකාවෙහි සමාගම් විශාල සංඛ්‍යාවක් ඇවරකරණයට භාජන කිරීමේ තීරණයන්ට එළැඹීමට ඒවායෙහි අධ්‍යක්ෂ මණ්ඩලයන්ට සිදු විය හැකි බවට ද අදහසක් බොහෝ අංශයන් තුළ මතු වී තිබේ. කාර්යක්ෂම ප්‍රතිව්‍යුහගත කිරීමේ ක්‍රියාවලීන් අප ගේ නීතිය යටතේ ඉදිරිපත් කරනු ලැබ තිබුණේ නම්, එවැනි තත්ත්වයන් අර්ථවත් ලෙස පාලනය කළ හැකිව තිබිණි. කෙසේ වුව ද එවැනි යාන්ත්‍රණයක් නොමැති වීමත්, අධ්‍යක්ෂවරුන් ගේ කාර්යභාරයන් ඉටු කිරීමෙහි ලා සුදුසුකම් ලත් පුද්ගලයන් පිරිසක ගේ හිඟයක් හේතු කොටගෙන මෙකී අවශ්‍යතාව සමාගම්වලට අනවශ්‍ය බරක් වී ඇති බව පෙනෙන්නට ඇත.

පනත ක්‍රියාවට නැංවීමේ දී මතු වන තවත් ගැටලුවක් වන්නේ, මෙම පනතෙහි මුලින් ප්‍රකාශයට පත් සිංහල පිටපත හා එහි ඉංග්‍රීසි පරිවර්තනය අතර පරස්පරතා තිබීමයි. මෙය ප්‍රායෝගික ගැටළුවක් වන අතර එවැනි පරස්පරතා ගණනාවක් මේ වන විට හමු වී ඇති බව වාර්තා වෙයි. කිසියම් ගැටලුවක් පිළිබඳ අධිකරණයක් වෙතින් තීරණයන් අපේක්ෂා කිරීමේ දී මෙවැනි පරස්පරතාවන් හා සම්බන්ධයෙන් කටයුතු කළයුතු ආකාරය පිළිබඳ අවිනිශ්චිතතාවන් ඇති වන බැවින් ඒවා තවත් ගැටළු මතු කරවන හේතූන් වීමට ඉඩ කඩ තිබේ.

මෙකී ගැටළු ඇති බව පිළිගෙන යෝග්‍ය පරිදි ඒවා සම්බන්ධව පියවර ගත යුතු ය. එවැනි ඇතැම් පියවරයන් වශයෙන් පනතෙහි සංශෝධනයන් අනිවාර්යයෙන් ම ඇති කළ යුතු වෙයි. කොටස් වෙළෙඳ පොළෙහි හා මහ බැංකුවෙහි නියමයන් වැනි විවිධ නියමයන් පනතෙහි ප්‍රතිපාදනයන් සමඟ සුසංගත කිරීම පිණිස අවශ්‍ය නොයෙකුත් පියවර ද මෙයට අමතරව ගත යුතු වන්නේ ය. මෙකී පියවර අප්‍රමාදව ගනු නො ලැබුවහොත්, පනතෙහි සමස්ත අරමුණ යථාර්ථයක් නොවනු ඇත.



ප්‍රධාන දේශක අරිත්ත වික්‍රමනායක මහතා සභාව අමතමින්...



රැස්වීම් සභාවෙන් කොටසක්...



සංවාද මඩුල්ල..
අරිත්ත වික්‍රමනායක මහතා
අනුෂා කුමාරස්වාමි මහත්මිය
මහාචාර්ය එච්.එම් සෆ්රුල්ලා
කිත්සිරි ගුණවර්ධන මහතා

## කර්තෘ ගැන...

අරිත්ත වික්‍රමනායක මහතා 1980 වසරේදී නීතිඥයෙකු වශයෙන් දිවුරුම් දුන් අතර 1981 රජයේ නීතිඥයෙකු වශයෙන් නීතිපති දෙපාර්තුමේන්තුවට ඇතුලත් විය. 1993 දී මොහු විනිමය සුරැකුම් කොමිෂන් සභාවේ විධායක අධ්‍යක්ෂකවරයා ලෙස පත්විය. ඉන් අනතුරුව පොදු ව්‍යවසාය ප්‍රතිසංස්කරණ කොමිසමේ (PERC) සාමාජිකයකු ලෙසද, ගිණුම්කරණ හා විගණන පිළිබඳ ප්‍රමිති මණ්ඩලයේ සාමාජිකයකු ලෙස ද කටයුතු කලේය. වර්තමානයේ මොහු නිත්‍ය නීති සමාගමේ ප්‍රධාන නිති හවුල්කරු වශයෙන් කටයුතු කරන අතර මොහු සමාගම් නීතියේ විනිමය පාලක හා ව්‍යපාර නීතිය සම්බන්ධයෙන් විශේෂයෙන් කටයුතු කරයි. මොහු බෙල්ජියමේ (බ්‍රසලස්) විරිජේ (Vrije) විශ්ව විද්‍යාලයෙන් හා ඇමරිකාවේ ජෝර්ජියා විශ්ව විද්‍යාලයෙන් නීතිය පිළිබඳ විද්‍යාපති උපාධියද ලබා ඇත. එසේම ඇමරිකාවේ ටෆ්ට් (Tufts) විශ්ව විද්‍යාලයෙන් නීතිය හා රාජ්‍ය තාන්ත්‍රික භාවය පිළිබඳ විද්‍යාපති උපාධියක් ලබා ඇත.

# සංවාද...

සංවාද සන්නිවේදන පත්‍රිකාවේ පස්වන ප්‍රකාශනය මේ සමඟ ඔබ අතට පත් කරමු. මෙම පත්‍රිකාව මගින් සමාගම් නීතියේ සංවර්ධනයක් සනිටුහන් කරන 2007 අංක 7 දරණ නව සමාගම් පනත ගැන විශ්ලේෂනාත්මක විග්‍රහයක් සපයයි.මෙම පත්‍රිකාව සකස් කරන ලද්දේ වර්ෂ 2007 ක් වු ඔක්තෝබර් 18 වන දින පැවැති "සංවාද ප්‍රජා හමුව"ට අරිත්ත වික්‍රමනායක මහතා විසින් ඉදිරිපත් කරන ලද විශ්ලේෂනාත්මක පත්‍රිකාව පදනම් කරගෙනයි.මෙම පත්‍රිකාව **www.sanvada.org** මගින් ලබා ගෙන ඇත.

ශ්‍රී ලංකාවෙහි සමාජ-ආර්ථික සංවර්ධනයෙහි ලා වැදගත් වන්නා වූ වර්ධනයන් පිළිබඳව ප්‍රතිපත්ති සම්පාදකයන් වන පාර්ලිමේන්තුව ද, එසේ ම ජන සමාජ කණ්ඩායම් ද පොදු ජනතාව ද අතර පර්යේෂණාත්මක හා සාධනීය සංවාදයන්ට සහයෝගීව මැදිහත් වෙමින් උත්ප්‍රේරණීය (catalytic) කාර්යයන් හි නියැලීම, ලාභාපේක්ෂා රහිත හා අපක්ෂපාතී ආයතනයක් වන පාත්ෆයින්ඩර් පදනමෙහි මෙහෙවරයි.

පාත්ෆයින්ඩර් පදනමෙහි සංවාද වැඩසටහන දියත් කෙරෙන්නේ ශ්‍රී ලාංකීය සමාජයට හා ආර්ථිකයට බලපාන ආකාරයෙන් යෝජිතව හා අපේක්ෂිතව ඇති ව්‍යවස්ථාමය පියවරයන් පිළිබඳව පාර්ලිමේන්තුව තුළ මෙන් ම ඉන් බැහැරව ද හරවත් විවේචනාත්මක විශ්ලේෂණයන් හා සංවාදයන් ඇති කරවීම පිණිසයි.

ජනතාව ගේ යහ පැවැත්ම විෂයෙහි අතිශයින් වැදගත් වන්නා වූ වර්තමාන හා ක්‍රියාත්මක කිරීමට තිබෙන අණපනත් මත වූ ලේඛණයන් සංවාද වැඩසටහන මගින් සකස් කැරෙයි. අදාළ විෂයයෙහි ප්‍රවීනයන් විසින් සකසනු ලබන මෙකී ලේඛණයන් හි අවසාන නිමැවුම එළි දකින්නේ සූක්ෂම විමර්ශනයන්ට හා ප්‍රජා රැස්වීම්වල දී දිගු සාකච්ඡාවන්ට භාජන කිරීමෙන් අනතුරුව ය. සංක්ෂේපනයන් ගෙන් හා සංස්කරණයන් ගෙන් පසුව ඒවා මෙම පුවත් හසුනෙහි ස්වරූපයෙන් මුද්‍රිතව 'සංවාද' ශීර්ෂය යටතේ පාර්ලිමේන්තු සභිකයන්, ප්‍රතිපත්ති සම්පාදකයන්, මාධ්‍යවේදීන්, වෘත්තීය සමිති, වාණිජ මණ්ඩල, විද්වතුන්, ප්‍රජා සංවිධානයන් මෙන් ම උනන්දුවක් දක්වන අනෙකුත් රටවැසියන් අතට ද පත් වීම සඳහා නිකුත් කෙරෙන්නේ ය.

'සංවාද' සඳහා ඔබට අපි සාදරයෙන් ආරාධනය කරමු. එසේ ම වැඩසටහනෙහිත් මෙම පුවත් හසුනෙහි අන්තර්ගතයන්හිත් ප්‍රවර්ධනය පිණිස ඔබ ගේ සංස්කරණාත්මක විවේචනයන් ද අපේක්ෂා කරමු. ආර්ථික ප්‍රතිපත්ති සම්පාදනයෙහිත්, එසේ ම රටෙහි ආයතනික, සමාජමය, ආර්ථිකමය හා දේශපාලණමය පරිපාලන කාර්යයන්හිත් සාධනීය වෙනස්කම් පිණිස ඉවහල් වන සේ පාර්ලිමේන්තුව තුළ හා ඉන් බැහැර කතිකාවන් සහ මහජන සාකච්ඡාවන් ඉහළ ප්‍රමිතියකට ගෙන ඒම සඳහා අපි එක්ව ක්‍රියාත්මක වෙමු.

පාත්ෆයින්ඩර් පදනම

දුරකතන : 2596281 ෆැක්ස් : 2595894
ඊ මේල් : info@pathfinderfoundation.org
අන්තර්ජාල අඩවිය : www.sanvada.org
සංස්කාරක සහාය : ශාමිලා දළුවත්ත, ව්‍යාපෘති කළමණාකාර